චක්‍රලේඛ අංක: 04/2006

මගේ අංකය:- බප/සසේකො/ලේ.තිරි/2006
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක.50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2006.02.23

බස්නාහිර පළාතේ
සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස.සමිතිවල
සභාපති වරුන් වෙත.

පත්කිරීම් ක්‍රියාවලියේදී කාර්යය විධිවිධාන සංග්‍රහයේ
නියමයන්ට පටහැනිව ක්‍රියා කිරීම.

---

පුරප්පාඩු ප්‍රසිද්ධියට පත්කිරීමේදී යම් යම් අවස්ථාවල කාර්යය විධිවිධාන සංග්‍රහයේ නියමයන් අනුගමනය නොකරන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

(1) තනතුරට නියමිත සුදුසුකම් නිවැරදිව සඳහන් නොවීම.

(2) වැටුප් ක්‍රමය (දැනට ක්‍රියාත්මක වන) සහ ඊට අමතරව ගෙවනු ලබන දීමනා නිවැරදිව සඳහන් නොකිරීම.

(3) අයදුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලසීමාවක් ලබා නොදීම.

(4) පුරප්පාඩුව සඳහා ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබාදුන් බවට කරුණු ඉදිරිපත් නොවීම.

2. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව, කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොලබා තාවකාලික වශයෙන් පත්කරනු ලැබූ බව සඳහන් කරමින් කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත්වීම.

මේ සම්බන්ධයෙන් කාර්යය විධිවිධාන සංග්‍රහයේ 1:4 පරිච්ඡේදය කෙරෙහි අවධානය යොමු කරවනු ලබන අතර, සමිති විසින් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය රහිතව කුමන හෝ පදනමක් මත කරනු ලබන පත්වීම් කාලසීමාව නොසලකා හැරීමටත්, කොමිෂන් සභාව විසින් පත්වීම අනුමත කරනු ලබන දින සිට එම පත්වීම් ක්‍රියාත්මක විය යුතු බව දැනුම් දෙනු ලැබේ.

3. තවද, කාර්යය විධිවිධාන සංග්‍රහයේ 1:7:2 (අ), (ආ), (ඇ) කෙරෙහිද අවධානය යොමු කරවනු ලබන අතර, මින් ඉදිරියට සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ එකඟතාවයකින් යුතුව තාවකාලිකව බඳවාගෙන ඇති සේවකයින්ගේ පමණක් මාස 06 ක් නොඉක්මවන තාවකාලික සේවා කාලය පිළිබඳ සලකා බලනු ලැබේ.